66379 [redacted]

OL/2025(2026)/61/S-I, II

සියලු ම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

**61 | S | I, II**

| පත්‍රය | ලකුණු |
|---|---|
| I | |

| | |
|---|---|
| පරීක්ෂක 1 | |
| පරීක්ෂක 2 | |
| EMF | |

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025(2026)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025(2026)**
**General Certificate of Education (Ord. Level) Examination, 2025(2026)**

| | |
|---|---|
| **භූගෝල විද්‍යාව** | **I, II** |
| புவியியல் | **I, II** |
| Geography | **I, II** |

**පැය තුනයි**
மூன்று மணித்தியாலம்
*Three hours*

**අමතර කියවීම් කාලය** - **මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## භූගෝල විද්‍යාව I

විභාග අංකය: ........................

**උපදෙස්:**

- ✻ මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න **40** කින් සමන්විත ය.
- ✻ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.

● අංක **1** සිට **5** තෙක් ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා **තිත් ඉර මත ලියන්න.**

**1.** පෘථිවි වායුගෝලයේ සංයුතිය අනුව එහි වැඩිපුරම අන්තර්ගතව ඇත්තේ ................................ වායුව ය.
(කාබන්ඩයොක්සයිඩ් / ඔක්සිජන් / නයිට්‍රජන්)

**2.** පෘථිවියේ ජල ව්‍යාප්තිය අනුව ගංගා, ඇළ දොළ, විල් හා ජලාශවල ඇති ජලය ................................ ජලය ලෙස හැඳින්වේ.
(භූතල / භූගත / පාංශු)

**3.** ලෝකයේ වාර්ෂික මිනිරන් නිෂ්පාදනයෙන් 60% ක් පමණ ........................................ විසින් නිපදවයි.
(ශ්‍රී ලංකාව / මැඩගස්කරය / ඉන්දියාව)

**4.** ශ්‍රී ලංකාවේ දැඩි ස්වභාවික රක්ෂිතයක් ලෙස ........................................................ සැලකේ.
(සිංහරාජ / යාල / විල්පත්තු)

**5.** ලෝකයේ මුළු බිම් ප්‍රමාණයෙන් ........................................ පමණ ජනහීන ප්‍රදේශ වේ.
(25% / 65% / 75%)

● අංක **6** සිට **10** තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් '**නි**' යන්න වටා ද වැරදි නම් '**වැ**' යන්න වටා ද රවුමක් අඳින්න.

**6.** පැපුවා නිව්ගිනියා සහ ටස්මේනියා යන දූපත් පිහිටා ඇත්තේ ඕස්ට්‍රේලියා මහාද්වීප තටකය තුළ ය. **නි / වැ**

**7.** ආසියාවෙන් බැහැර වී වගා කරන ප්‍රදේශයක් වූ 'සැක්‍රමැන්ටෝ' ගංගා නිම්නය ඕස්ට්‍රේලියාවේ පිහිටා ඇත. **නි / වැ**

**8.** තරගකාරී වෙළෙඳපොළ සඳහා දරනු ලබන ප්‍රචාරණ වියදම් හේතුවෙන් නිෂ්පාදිත භාණ්ඩවල මිල පහළ මට්ටමක රඳවා ගැනීමට නිෂ්පාදකයන්ට හැකි වී ඇත. **නි / වැ**

**9.** ශ්‍රී ලංකාවේ පිඟන්මැටි ආශ්‍රිත නිෂ්පාදනවල දේශීය අලෙවියෙන් වැඩිම ආදායමක් උපයා ගනු ලබන්නේ පිඟන් ගඩොල් හා සනීපාරක්ෂක කට්ටල අලෙවිය මගිනි. **නි / වැ**

**10.** නායයෑම් සහ ජල ගැලීම් වැනි ස්වභාවික උපද්‍රව මානව ක්‍රියාකාරකම් නිසා තීව්‍රවන උපද්‍රව ලෙස හැඳින්විය හැකි ය. **නි / වැ**

● අංක **11** සිට **16** තෙක් ප්‍රශ්නවල හිස්තැන්, සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.

**11.** ශ්‍රී ලංකාවේ කඳුකර බිම්වල වී වගාව කෙරෙනුයේ ................................ වගා ක්‍රමයට අනුව ය.

**12.** ශ්‍රී ලංකාවේ කාර්මික අංශයේ අපනයන අතුරෙන් වැඩිම විදේශ විනිමයක් උපයනු ලබන්නේ ............................ අපනයනය මගිනි.

[දෙවැනි පිටුව බලන්න.

**13.** ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය, කර්මාන්ත හා සේවා යන අංශ තුන අතුරෙන් ශ්‍රම බලකායෙන් වැඩිම පිරිසක් රැකියාවල නිරතව ඇත්තේ ................................. අංශයෙහි ය.


**14.** පෘථිවි අභ්‍යන්තරයේ දී මැග්මා සිසිල් වී ඝනවීමෙන් ............................ ආග්නේය පාෂාණ නිර්මාණය වේ.

**15.** උතුරු අත්ලාන්තික් සාගර ප්‍රදේශයේ හටගන්නා වාසුළි ............................ නමින් හඳුන්වනු ලැබේ.

**16.** ගංගාවක් ............................ බෑවුමක් ඔස්සේ ගලා බසින විට දිය ඇල්ලක් නිර්මාණය වේ.

● අංක **17** සිට **19** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දී ඇති ප්‍රස්තාර සටහන උපයෝගී කර ගන්න.

**ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව හා සාමාන්‍ය වර්ධන අනුපාතිකය - 1871-2024 සංගණන වර්ෂ සඳහා**




**17.** ජන සංඛ්‍යාව ආසන්න වශයෙන් මිලියන 15 දක්වා වර්ධනය වූයේ ........................ සංගණන වර්ෂයේ දී ය.

**18.** ජන සංඛ්‍යා වර්ධන අනුපාතිකයේ උපරිමය දැක්වෙන්නේ ...................... සංගණන වර්ෂයේ දී ය.

**19.** මෑත භාගය තුළ ජන සංඛ්‍යා වර්ධන අනුපාතිකයේ කැපීපෙනෙන ලක්ෂණය වන්නේ එහි සීඝ්‍ර ...................... යි.

● අංක **20** සිට **24** තෙක් දී ඇති ප්‍රශ්නවල **'අ'** සහ **'ආ'** යනුවෙන් තීරු දෙකක් දක්වේ. **'අ'** තීරුවේ ඇති තොරතුරු අනුව **'ආ'** තීරුවේ ඇති තොරතුරු ගැළපූ විට නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන පිළිතුරට හිමි **අංකය, ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

**20.**

| 'අ' කඳුවැටිය | 'ආ' පිහිටි මහාද්වීපය |
|---|---|
| 1. මහා බෙදුම් කඳු | A - ආසියාව |
| 2. ඇට්ලස් කඳු | B - දකුණු ඇමෙරිකාව |
| 3. ඇන්ඩීස් කඳු | C - අප්‍රිකාව |
| | D - ඕස්ට්‍රේලියාව |

(1) A, B, C (2) B, C, D (3) C, D, A (4) D, C, B (……)

**21.**

| 'අ' යකඩ හා වානේ නිෂ්පාදන මධ්‍යස්ථාන | 'ආ' පිහිටා ඇති රට |
|---|---|
| 1. දකුණු මැංචූරියා | A - ඇමෙරිකා එක්සත් ජනපදය |
| 2. බර්මින්හැම් | B - එක්සත් රාජධානිය |
| 3. පිට්ස්බර්ග් | C - චීනය |
| | D - ඉන්දියාව |

(1) A, B, C (2) B, C, D (3) C, B, A (4) D, C, B (……)

[තුන්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

**22.**

| 'අ' ව්‍යාප්ති ප්‍රදේශය | 'ආ' ඛනිජ වර්ගය |
|---|---|
| 1. බෝගල | A - ඉල්මනයිට් |
| 2. බොරලැස්ගමුව | B - මිනිරන් |
| 3. ඇළහැර | C - කෙඔලින් |
| | D - මැණික් |

(1) A, B, C (2) B, C, D (3) C, B, D (4) D, B, A (……)

**23.**

| 'අ' පාෂාණ වර්ගය | 'ආ' ප්‍රයෝජන |
|---|---|
| 1. නයිස් | A - ගොඩනැගිලි හා මහා මාර්ග ඉදිකිරීම, ප්‍රතිමා නෙළීම |
| 2. ඩොලමයිට් | B - පොහොර නිෂ්පාදනය, අළු හුණු නිෂ්පාදනය |
| 3. මයෝසීන හුණුගල් | C - සිමෙන්ති නිෂ්පාදනය, යපස් උණු කිරීම |
| | D - පිඟන් ගඩොල් නිෂ්පාදනය |

(1) A, B, C (2) B, C, D (3) C, D, B (4) D, A, B (……)

**24.**

| 'අ' වනාන්තර වර්ගය | 'ආ' විශේෂ ලක්ෂණ |
|---|---|
| 1. නිවර්තන තෙත් | A - ගස්මුදුන් වියනක් සේ සෑදී ඇත. ගස්වල අපිශාක බහුලය. සපු, කීන, වල්දෙල් වැනි ගස් වර්ග බහුලය. |
| 2. වියළි මිශ්‍ර සදාහරිත | B - නියඟයට ඔරොත්තු දෙන ශාක බහුලය. පලු, වීර, එරමිණියා, කරඹ වැනි ගස් වර්ග බහුල ය. |
| 3. කටු පඳුරු හා ළඳු කැලෑ | C - වියන් ස්තර ගණනාවකි. ඝන යටි රෝපණයකින් සමන්විත වේ. තද කොළ පැහැති වනාන්තර වේ. |
| | D - වියළි කාලයේ දී කොළ හැලේ. වර්ෂා සෘතුවේ දී ශාක වර්ධනය සිදුවේ. කලුවර, මිල්ල, තේක්ක වැනි ගස් බහුලය. |

(1) A, B, C (2) B, C, D (3) C, D, B (4) D, A, C (……)

- අංක **25** සිට **37** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති වරණ අතුරෙන් **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරා ඊට හිමි **අංකය, ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

**25.** ආසියාවේ වී වගා කෙරෙන ප්‍රදේශ සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) බොහෝ ආසියානු රටවල ශ්‍රම සූක්ෂම වගාවක් ලෙස වී වගාව සිදුකෙරේ.
(2) ආසියානු රටවල ව්‍යාපාරික මට්ටමින් විශාල ගොවිබිම්වල වී වගාව සිදු කෙරේ.
(3) ආසියානු රටවල වී වගාව මුළුමනින්ම යාන්ත්‍රීකරණය වී ඇත.
(4) ආසියානු රටවල නිෂ්පාදනය කෙරෙන සහල් සඳහා ලොව පුරා පැතිරුණ වෙළෙඳපොලක් නිර්මාණය වී ඇත. (……)

**26.** පහතරට තේ වගාකරන දිස්ත්‍රික්කයක් වන්නේ,
(1) කෑගල්ල (2) මාතලේ (3) මහනුවර (4) මොණරාගල (……)

**27.** ශ්‍රී ලංකාවේ කිරිපට්ටි පාලනය දියුණු කිරීමට උපකාර කිරීම සඳහා කිරිගව සම්පත් හුවමාරු මධ්‍යස්ථානයක් පිහිටුවා ඇති ස්ථානය කුමක් ද?
(1) අඹේවෙල (2) කනන්විල
(3) වල්පිට (4) මීවනපලාන (……)

**28.** රබර් වගාව සඳහා සුදුසුම පස් වර්ගය කුමක් ද?
(1) රතු දුඹුරු පස (2) රතු කහ ලැටසොල් පස
(3) කබොක් මිශ්‍ර රතු පස (4) චූර්ණමය නොවූ දුඹුරු පස (……)

**29.** ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික බෝග වගාවන් සඳහා යොදා ඇති බිම් ප්‍රමාණයෙන් වැඩිම බිම් කොටසක් අයත් වන්නේ මින් කුමන වගාවට ද?
(1) තේ (2) රබර්
(3) පොල් (4) සුළු අපනයන බෝග (……)

**30.** ලෝකයේ විද්‍යුත් උපාංග නිෂ්පාදනයේ ප්‍රමුඛයා බවට වර්තමානයේ පත්ව ඇති රට
(1) ජපානයයි. (2) චීනයයි.
(3) ඉන්දියාවයි. (4) දකුණු කොරියාවයි. (……)

**31.** ශ්‍රී ලංකාවේ ජල විදුලි බලාගාර සහ ඒ හා සම්බන්ධ ගංගා දක්වා ඇති යුගල අතුරෙන් **නොගැළපෙන** වරණය තෝරන්න.
(1) සමනල වැව - වලවේ ගඟ (2) කැනියොන් - කලු ගඟ
(3) කොත්මලේ - මහවැලි ගඟ (4) ඉගිනියාගල - ගල්ඔය (……)

**32.** ලෝකයේ රටවල් අතුරෙන් වැඩිම ජන සංඛ්‍යා වර්ධන වේගය සහ අඩුම ජනසංඛ්‍යා වර්ධන වේගය ඇති රටවල් දෙක පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) ඉන්දියාව සහ රුසියාව (2) බංග්ලාදේශය සහ ඇමෙරිකා එක්සත් ජනපදය
(3) පකිස්තානය සහ චීනය (4) නයිජීරියාව සහ ජපානය (……)

**33.** වර්තමාන ලෝක ජනසංඛ්‍යාව පිළිබඳ නිවැරදි ප්‍රකාශය මින් කුමක් ද?
(1) මුළු ලෝක ජනසංඛ්‍යාව බිලියන අටකට අධික ය.
(2) වැඩිම ජනසංඛ්‍යාවක් වාසය කරන රට චීනයයි.
(3) සංවර්ධිත රටවල ජනසංඛ්‍යා වර්ධන වේගය ඉහළ ය.
(4) වැඩිම ජන සංඛ්‍යාවක් වාසය කරන මහාද්වීපය යුරෝපයයි. (……)

**34.** මානුෂ සංවර්ධන දර්ශකය අනුව ශ්‍රී ලංකාව අයත් වන්නේ මින් කුමන රටවල් කාණ්ඩයට ද?
(1) ඉතා ඉහළ මානුෂ සංවර්ධනයක් ඇති රටවල්
(2) ඉහළ මානුෂ සංවර්ධනයක් ඇති රටවල්
(3) මධ්‍යස්ථ මානුෂ සංවර්ධනයක් ඇති රටවල්
(4) පහළ මානුෂ සංවර්ධනයක් ඇති රටවල් (……)

**35.** ශ්‍රී ලංකාවට අකුණු සැර උපද්‍රව බහුලව බලපාන කාලසීමාව මින් කුමක් ද?
(1) වාසුළි වර්ෂාව ලැබෙන කාලසීමාව
(2) නිරිත දිග මෝසම් වර්ෂාව ලැබෙන කාලසීමාව
(3) ඊසාන දිග මෝසම් වර්ෂාව ලැබෙන කාලසීමාව
(4) අන්තර් මෝසම් වර්ෂාව ලැබෙන කාලසීමාව (……)

**36.** දේශගුණික වෙනස්කම් හට ගැනීම කෙරෙහි බලපාන මූලිකම සාධකය වන්නේ,
(1) ගෝලීය සුළං රටාවේ වෙනස්වීම් ය.
(2) හරිතාගාර ආවරණයයි.
(3) සූර්ය ලප හටගැනීමයි.
(4) ගෝලීය උණුසුම ඉහළ යාමයි. (……)

**37.** රටක වාර්ගික, ආගමික සහ අපනයන සංයුතිය වැනි දත්ත නිරූපණය කිරීම සඳහා සුදුසුම ප්‍රස්තාර වර්ගය වන්නේ,
(1) බෙදූ වෘත්ත ප්‍රස්තාරය (2) සරළ තීරු ප්‍රස්තාරය
(3) ද්විත්ව තීරු ප්‍රස්තාරය (4) බහු තීරු ප්‍රස්තාරය (……)

● පහත **A, B, C** සහ **D** මගින් දක්වා ඇති එකිනෙකට සම්බන්ධ මාතෘකා යුගල හොඳින් අධ්‍යයනය කොට අංක **38** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**A** - 1. නාගරීකරණය
2. පාරිසරික ගැටලු

**B** - 1. වාසුළි ක්‍රියාකාරීත්වය
2. දේශගුණික විපර්යාසය

**C** - 1. අසම ජන ව්‍යාප්තිය
2. යටිතල පහසුකම්

**D** - 1. බාල වයස් ජනසංඛ්‍යාව
2. ශ්‍රම බලකාය

**38.** පළමුවැන්න හා සම්බන්ධ ගැටලු අවම කිරීමට දෙවැන්නේ වර්ධනය හේතු වේ යයි සිතිය හැකි මාතෘකා යුගලය කුමක් ද?
(1) **A** (2) **B** (3) **C** (4) **D** (……)

**39.** දෙවැන්න හා සම්බන්ධ ගැටලු ඇතිවීමට පළමුවැන්නේ අඩුවීම හේතු විය හැකි බවට දැක්විය හැකි මාතෘකා යුගලය කුමක් ද?
(1) **A** (2) **B** (3) **C** (4) **D** (……)

**40.** පළමුවැන්නේ වර්ධනය දෙවැන්නේ ද වර්ධනයට හේතු වේ යයි සිතිය හැකි මාතෘකා යුගලය කුමක් ද?
(1) **A** (2) **B** (3) **C** (4) **D** (……)

❊ ❊

[පස්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

61 | S | I, II

66616

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025(2026)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025(2026)
General Certificate of Education (Ord. Level) Examination, 2025(2026)

| | |
|---|---|
| භූගෝල විද්‍යාව | I, II |
| புவியியல் | I, II |
| Geography | I, II |

## භූගෝල විද්‍යාව II

* මෙම ප්‍රශ්න පත්‍රය I හා II වශයෙන් කොටස් **දෙකකින්** සමන්විත ය.
* I කොටසේ 01 ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි (අ), (ආ) සහ (ඉ) කොටස් **තුනට ම** පිළිතුරු සැපයිය යුතු ය.
* II කොටසින් ප්‍රශ්න **හතරකට** පිළිතුරු සැපයිය යුතු ය.
* පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **පහකි.**

### I කොටස

**1.** (අ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකාවේ 1:50,000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කර, ඒ ඇසුරෙන් අසා ඇති පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු ලිවීම සඳහා ඔබ වෙත සපයා ඇති කඩදාසිය (පිටු අංක **8**) යොදා ගන්න.

- අංක (i) සිට (v) තෙක් ඇති ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

(i) සිතියමෙහි දිශා සටහනෙහි Ⓐ අක්ෂරයෙන් දක්වා ඇති දිශාව කුමක් ද?
(සැබෑ උතුර / ජාල උතුර / චුම්බක උතුර) (ලකුණු 01 යි)

(ii) ඇතුළු මායිම් තීරුවෙහි Ⓑ අක්ෂරයෙන් දක්වා ඇත්තේ කිනම් සංඛ්‍යාමය අගයක් ද?
(අක්ෂාංශ / දේශාංශ / ඛණ්ඩාංක) (ලකුණු 01 යි)

(iii) Ⓒ ස්ථානයේ දී A09 මහා මාර්ගය විහිදී ඇත්තේ කුමන භූ ලක්ෂණයක් ඔස්සේ ද?
(ජල කපොල්ල / හෙල්වැටිය / මොහොර) (ලකුණු 01 යි)

(iv) Ⓓ අක්ෂරයෙන් දක්වා ඇති පරිපාලන මායිම කුමක් ද?
(ප්‍රාදේශීය ලේකම් / දිස්ත්‍රික්ක / පළාත්) (ලකුණු 01 යි)

(v) Ⓟ අක්ෂරයෙන් දක්වා ඇති සමචතුරස්‍රාකාර බිම් කොටසේ වර්ග ප්‍රමාණය කොපමණ ද?
(01 $km^2$ / 01.5 $km^2$ / 02 $km^2$) (ලකුණු 01 යි)

(vi) Ⓟ අක්ෂරයෙන් දැක්වෙන ප්‍රදේශය තුළ සම්මත සංකේත මගින් දක්වා ඇති පොදු සේවා සපයන ආයතන **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

- සිතියම් ප්‍රදේශය පිළිබඳ ප්‍රකාශ තුනක් (vii), (viii) හා (ix) යන ප්‍රශ්නවලින් දක්වා ඇත. ඒ එක් එක් ප්‍රකාශය කියවා ඒවා නිවැරදි නම් '**නි**' යන්න ද වැරදි නම් '**වැ**' යන්න ද පිළිතුරු පත්‍රයේ ඒ ඒ ප්‍රශ්න අංකය ඉදිරියෙන් ලියා දක්වන්න.

(vii) සිතියම් ප්‍රදේශය තුළ වී, තේ, රබර් හා පොල් යන වගාවන් හතරම ව්‍යාප්තව ඇත. (ලකුණු 01 යි)

(viii) සිතියම් ප්‍රදේශයේ ප්‍රධාන ගංගාව උතුරු මායිමෙන් ආරම්භ වී ගිණිකොණ මායිම දක්වා ගලා බසී. (ලකුණු 01 යි)

(ix) සිතියම් ප්‍රදේශයේ A09 මහා මාර්ගය ඔස්සේ Ⓧ ස්ථානයෙන් ගමන් ආරම්භ කරන යතුරු පැදි කරුවෙක් Ⓨ ස්ථානය දක්වා පැමිණියේ නම් ඔහු ගමන් කළ මුළු දුර ප්‍රමාණය 10 km වේ. (ලකුණු 01 යි)

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලෝක සිතියමට යාබදව ඇති කොටු (පිටු අංක **9**) යොදා ගන්න.

- අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් ඉංග්‍රීසි අක්ෂර තුනක් දක්වා ඇත. නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය ලෝක සිතියමෙන් තෝරා යාබදව ඇති නියමිත කොටුව තුළ ලියා දක්වන්න.

(i) ජැමෙයිකා දූපත - Ⓐ, Ⓑ, Ⓒ
(ii) පැම්පාස් තණබිම - Ⓓ, Ⓔ, Ⓕ
(iii) නයිජීරියාව - Ⓖ, Ⓗ, Ⓘ
(iv) සිඩ්නි නගරය - Ⓙ, Ⓚ, Ⓛ
(v) කැම්චැට්කා අර්ධද්වීපය - Ⓡ, Ⓢ, Ⓣ (ලකුණු 05 යි)

[හයවැනි පිටුව බලන්න.

(ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලංකා සිතියමට යාබදව ඇති කොටු (පිටු අංක 9) යොදා ගන්න.

- අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් ඉංග්‍රීසි අක්ෂර තුනක් දක්වා ඇත. නිවැරදි පිළිතුර දක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා යාබදව ඇති නියමිත කොටුව තුළ ලියා දක්වන්න.

(i) මධුපාර අභය භූමිය - Ⓐ, Ⓑ, Ⓒ

(ii) නිලාවෙලි - Ⓓ, Ⓔ, Ⓕ

(iii) මඩකලපුව - Ⓖ, Ⓗ, Ⓘ

(iv) නිල්වලා ගඟ - Ⓙ, Ⓚ, Ⓛ

(v) හෝර්ටන් තැන්න - Ⓡ, Ⓢ, Ⓣ (ලකුණු 05 යි)

## II කොටස

**2.** (i) පෘථිවි ව්‍යුහයේ ප්‍රධාන ස්තර දෙකක් පිළිබඳ කෙටි විස්තරයක් බැගින් පහත (a) හා (b) යටතේ දක්වා ඇත.

(a) පෘථිවි අභ්‍යන්තරයේ පිහිටා ඇත. ද්‍රවමය ලෝහ හා ඝන ලෝහවලින් සමන්විත වේ.

(b) ප්‍රයෝජනවත් ඛනිජ වර්ග අන්තර්ගත වේ. මෙම ස්තරයේ ඝනකම මහාද්වීපවලදී 60 km පමණ ද සාගරවලදී 5 km පමණ ද වේ.

එම ස්තර **දෙක** මොනවාදැයි (a), (b) අනුපිළිවෙළින් නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ශිලාගෝලය නිර්මාණය වී ඇති විශාල භූ තැටි අතරින් **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(iii) ශිලාගෝලය හා පෘථිවි අභ්‍යන්තරය අතර හටගන්නා අන්තර්ක්‍රියාකාරිත්වය මිනිස් කටයුතුවලට අහිතකර ලෙස බලපාන අවස්ථා **තුනක්** සඳහන් කර ඉන් එක් අවස්ථාවක් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

**3.** (i) වතු කෘෂිකර්මයේ විශේෂ ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) ශ්‍රී ලංකාවේ ප්‍රධාන බෝග වර්ග දැනට මුහුණපා ඇති ගැටලු තුනක් පහත (a), (b), (c) යටතේ දක්වා ඇත. ඒ එක් එක් ගැටලුව ප්‍රබල ලෙස බලපා ඇති ප්‍රධාන බෝගය කුමක් දැයි (a), (b), (c) අනුපිළිවෙළින් දක්වන්න.

(a) ඉඩම් කැබලිකර විකිණීම

(b) ඉඩම් ගොඩකිරීම හා වෙනත් කටයුතුවලට යොදා ගැනීම

(c) ගුණාත්මක බවෙන් අඩු නිෂ්පාදන ජාත්‍යන්තර වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම (ලකුණු 03 යි)

(iii) ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සම්බන්ධයෙන් කෘෂිකර්මාන්තය වැදගත් වීමට හේතු **තුනක්** සඳහන් කර ඉන් එකක වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

**4.** (i) A - උතුරු අක්ෂාංශ 23 1/2 ° හා දකුණු අක්ෂාංශ 23 1/2 °

B - උතුරු අක්ෂාංශ 23 1/2 ° හා උතුරු අක්ෂාංශ 66 1/2 °

ඉහත A හා B යටතේ දක්වා ඇති එක් එක් අක්ෂාංශ සීමා තුළ ව්‍යාප්තව ඇති ප්‍රධාන දේශගුණ කලාප **දෙක** මොනවාදැයි අනුපිළිවෙළින් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) (a) ඉහත (i) හි ඔබ සඳහන් කළ B දේශගුණ කලාපයෙහි ව්‍යාප්තව ඇති වනාන්තර වර්ගය සඳහන් කරන්න.

(b) එම වනාන්තරවල විශේෂ ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) ලෝකයේ දේශගුණික වෙනස්කම් හට ගැනීම කෙරෙහි වන විනාශය බලපාන ආකාරය පිළිබඳ කරුණු **තුනක්** සඳහන් කර ඉන් එකක් සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 05 යි)

[හත්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

5. (i) වර්තමානයේ නැව් තැනීමේ කර්මාන්තයට වැදගත් ආසියානු රටවල් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ප්‍රවාහන මාධ්‍යයක් ලෙස නාවික ප්‍රවාහනය වැදගත්වීමට හේතු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) ශ්‍රී ලංකාවේ 'පෙට්‍රෝ රසායන කර්මාන්තය' දියුණු කිරීමේ වාසි **දෙකක්** හා අවාසි **එකක්** නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

6. (i) ශ්‍රී ලංකාවේ සංවර්ධනය සඳහා මෑත කාලීනව වැඩි අවධානයක් යොමු කළ සංවර්ධන ව්‍යාපෘති **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) තිරසර සංවර්ධනය කෙරෙහි ලෝකයේ රටවල අවධානය යොමුවීමට බලපෑ හේතු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) සංවර්ධන ක්‍රියාවලියේ දී තොරතුරු සන්නිවේදන තාක්ෂණය භාවිත කිරීම නිසා අත්වන ප්‍රතිලාභ **තුනක්** සඳහන් කර ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

7. (i) ශ්‍රී ලංකාවේ වර්තමානයේ භාවිත වන පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)


(ii) පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර භාවිතය මගින් අත්වන වාසි **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) පුනර්ජනනීය බලශක්ති භාවිතය ප්‍රචලිත කිරීම සඳහා ශ්‍රී ලංකාවේ රජය හා පෞද්ගලික අංශය මගින් ගෙන ඇති ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

8. (i) ශ්‍රී ලංකාවට සංචාරකයින් වැඩිපුරම පැමිණෙන රටවල් **දෙකක** නම් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) යාබද සිතියමේ Ⓐ, Ⓑ හා Ⓒ මගින් දක්වා ඇති සංචාරක කලාප **තුන** මොනවා දැයි අනුපිළිවෙළින් සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග නිදසුන් **තුනක්** දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)




* * *

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව/இலங்கைப் பரீட்சைத் திணைக்களம்/Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025 (2026)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025 (2026)
General Certificate of Education (Ord. Level) Examination, 2025 (2026)

විභාග අංකය / சுட்டெண் / Index Number ....................................

66616

(61) භූගෝල විද්‍යාව II
புவியியல் II
**Geography II**

| පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය පිණිසයි. / பரீட்சகரின் உபயோகத்திற்கு மட்டும் / For Examiner's Use Only |
|---|

1. (අ) /(அ) /(a)

(i) ........................................................................................

(ii) ........................................................................................

(iii) ........................................................................................

(iv) ........................................................................................

(v) ........................................................................................

(vi) ........................................................................................

........................................................................................

(vii) ........................................................................................

(viii) ........................................................................................

(ix) ........................................................................................

10

මෙතැනින් වෙන් කරන්න/ இங்கே வேறாக்கவும்/ Detach here

PAST PAPERS WIKI



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(ආ) /(ஆ) /(b)




(i)

(ii)


(iii)

(iv)

(v)

5

(ඉ) /(இ) /(c)




(i)

(ii)

(iii)

(iv)

(v)

5

පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය පිණිසයි. பரீட்சகரின் உபயோகத்திற்கு மட்டும். For Examiner's Use Only.

1. (අ) (அ) (a) $\frac{}{10}$ (ආ) (ஆ) (b) $\frac{}{5}$ (ඉ) (இ) (c) $\frac{}{5}$ = $\frac{}{20}$

66169

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**61 II**

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025 (2026)
## கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025 (2026)
## General Certificate of Education (Ord. Level) Examination, 2025 (2026)

### භූගෝල විද්‍යාව II / புவியியல் II / Geography II





SCALE : 1 : 50,000

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න


# 11 ශ්‍රේණිය කෙටි සටහන් පොත් සංශෝධිත නව විෂය නිර්දේශයේ පාඩමෙන් පාඩමට



Rs : 300




Rs : 300



Rs : 300




Rs : 300




Rs : 300




Rs : 300



Rs : 350



Rs : 300



Rs : 300



Rs : 200




Rs : 200




Rs : 200




Rs : 250




Rs : 250




Rs : 200




Rs : 200



Rs : 200




Rs : 300




Rs : 300



Rs : 200



Rs : 200



Rs : 250




Rs : 650


මෙම කෙටි සටහන් පොත් සකස් කොට ඇත්තේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදනය කොට ඇති නව විෂය නිර්දේශය අනුව, විෂය ප්‍රවීණත්වයෙන් යුත් සම්පාදක මණ්ඩලයක් විසිනි, එහෙයින් මෙහි අන්තර්ගත සියලු සටහන් එම විෂය නිර්දේශයේ සෑම මාතෘකාවක්ම ආවරණයකොට තිබේ. මෙම ග්‍රන්ථ සම්පාදනය කිරීමේ දී පූර්ණ අවධානය යොමුකොට ඇත්තේ සිසුන්ට මෙන්ම ගුරුවරුන්ට ද අවශ්‍යයෙන්ම මතකයේ තබා ගත යුතු සියලු කරුණු අන්තර්ගත කරමින් වන හෙයින් වෙනත් අතිරේක ග්‍රන්ථ පරිහරණයකින් තොරව වුවද අදාල විෂය නිර්දේශයේ වැදගත් කරුණු සියල්ල ඉතා පහසුවෙන් හැදෑරීමේ මෙන්ම මතකයේ රඳවා ගැනීමේ හැකියාව ද ලැබෙනු ඇත.

LOL.LK
LOL STORE (PVT) LTD
CASH ON DELIVERY
VISA
mastercard
KOKO
037 20 60 110
071 77 74 440
Buy Now
CLICK HERE


# 11 ශ්‍රේණි ඉංග්‍රීසි මාධ්‍ය කෙටි සටහන් පොත් ENGLISH MEDIAM SHORT NOTE BOOKS Rs 180/-





Rs : 180





Rs : 180





Rs : 180





Rs : 180





Rs : 180





Rs : 180





Rs : 180




Rs : 180




Rs : 180




Rs : 180

මෙම කෙටි සටහන් පොත් සකස් කොට ඇත්තේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදනය කොට ඇති නව විෂය නිර්දේශය අනුව, විෂය ප්‍රවීණත්වයෙන් යුත් සම්පාදක මණ්ඩලයක් විසිනි, එහෙයින් මෙහි අන්තර්ගත සියලු සටහන් එම විෂය නිර්දේශයේ සෑම මාතෘකාවක්ම ආවරණයකොට තිබේ. මෙම ග්‍රන්ථ සම්පාදනය කිරීමේ දී පූර්ණ අවධානය යොමුකොට ඇත්තේ සිසුන්ට මෙන්ම ගුරුවරුන්ට ද අවශ්‍යයෙන්ම මතකයේ තබා ගත යුතු සියලු කරුණු අන්තර්ගත කරමින් වන හෙයින් වෙනත් අතිරේක ග්‍රන්ථ පරිහරණයකින් තොරව වුවද අදාල විෂය නිර්දේශයේ වැදගත් කරුණු සියල්ල ඉතා පහසුවෙන් හැදෑරීමේ මෙන්ම මතකයේ රඳවා ගැනීමේ හැකියාව ද ලැබෙනු ඇත.

LOL.LK
LOL STORE (PVT) LTD
CASH ON DELIVERY | VISA | mastercard | KOKO
037 20 60 110
071 77 74 440
Buy Now
CLICK HERE